# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ආර්ථික කටයුතු පිලිබඳ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 නොවැම්බර් මස ...24...... වැනි දින සිට මාස 6 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.09.07 දිනැති අංක 2087/76 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0713.10.10 සහ 0713.10.20 යටතේ වන මෑ වර්ගයේ ඇට (වටානා) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2018 නොවැම්බර් මස ...24....... වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය

2018 නොවැම්බර් මස ..23..... දින,
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේදීය.

## උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 07.13 | 0713.10.10 | සම්පූර්ණ - මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 5.00 |
| | | 0713.10.20 | පියළි කළ - මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 8.00 |